## 2017 අප්‍රියෙල් මස සන්නසෙහි පළ වූ "දොස්තර වර්ජනය සහ රාජපක්ෂ වාදය" ලිපියට පිළිතුරකි

**විජිත ඉලුක්පිටිය**
බෙරික්



# විරෝධතා රැල්ල සහ රාජපක්ෂ නාමය

2017 අප්‍රියෙල් මස ''සන්නස'' පුවත් පතෙහි පළකර තිබූ ''දොස්තර වර්ජනය සහ රාජපක්ෂ වාදය'' යන ලිපියේ සඳහන් කරුණු කොතෙක් දුරට සාධාරණදැයි විමසා බැලීම මෙම ලිපියේ මූලික අදහසයි.

රජයක් විවේචනය කිරීමේදී සම්පූර්ණයෙන් පක්ෂග්‍රාහී වීම පිළිකුල් කළ යුතුය. පාර්ශවයන් සියල්ලක්ම හොඳින් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව සාධාරණ විවේචන කවුරුත් අනුමත කරනු ඇත.

එම ලියුම්කරු දොස්තර වැඩවර්ජනය බරපතල ලෙස විවේචනය කරමින් එක් තැනක කියා ඇත්තේ වෛද්‍ය සංගමය රෝගී ජීවිත සියගණනනක් ඝාතනය කරමින් උද්ඝෝෂණ සිදු කරන බවයි. මෙම සඳහන දොස්තර සංගමයට කරන ලද බරපතල චෝදනාවක් මෙන්ම නිගරුවක් ද වේ. සුළු අසුළු අතපසු වීම් තිබුණද ''දොස්තරවරු දෙවිවරු'' බවට සාමාන්‍ය ජනයාගේ මතය එලෙසම පවතින බව කිය යුතුය.

අනෙක් කරුණ නම් පසුගිය රජයන්ගේ පාලන කාලයේ පවා දොස්තර වර්ජන නොතිබුණා නොවේ. එවිට ඔවුන් ඝාතකයින් නොව සර්ව සාධාරණ අයයි. වැඩ වර්ජන සේවකයින්ගේ අයිතිවාසිකමක් බවද සිහිපත් කර ගත යුතුය.

දැනට පවතින යහපාලනයයි කියාගන්නා රජය විසින් ගෙන යනු ලබන ඉතාමත් අදූරදර්ශී මෙන්ම විනාශකාරී ක්‍රියා මාර්ග වලට එරෙහිව විශාල විරෝධතා රැල්ලක් පවතී. එම විරෝධතා රැල්ල මෙහෙයවනු ලබන්නේ විවිධ වෘත්තීයවේදීන් (දොස්තරවරුන් ද ඇතුළුව) මහා සංඝරත්නය, විවිධ සිවිල් සංවිධාන සහ එමෙන්ම විපක්ෂය ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරීන්ය. ඔවුන් සියලු දොනම එකම අරමුණක් කරා වැඩ කරණු විනා කිසිවෙකුගේ වහලුන් නොවන බව අවධාරණය කරණු කැමැත්තෙමි. කිසිසේත්ම එය රාජපක්ෂ වාදය නොවේ.

2015 ජනවාරි 08 වන දා බලයට පැමිණි මෙම රජය මුළුමනින්ම ජනතාව මුලා කොට රට විනාශකාරී මාවතකට යොමු කර ඇති බව පැහැදිලි සත්‍යයකි. තවදුරටත් මේ පිළිබඳව සඳහන් කළ හොත් ඔවුන්ගේ එකම හො රණෑව බවට පත් වී ඇත්තේ රාජපක්ෂවරුන්ට පරිභව කිරීම සහ ඔවුන්ගෙන් පලිගැනීම පමණකි. ඒ විනා කිසිදු සංවර්ධන සැලැස්මක් හෝ මහජනතාවට සහන සැලසීමේ වැඩපිළිවෙලක් ඔවුන් සතුව නැත. හැකි තරම් මහජනතාවගේ සහන කප්පාදුව සහ බදු පිට බදු පනවමින් ඔවුන් සුපුරුදු සොරකමේ යෙදී සිටී.

නමුත් ඔවුන්ගේ එම වැඩපිළිවෙල සහ නොහැකියාව රාජපක්ෂවාදය නම් වූ කඩතුරාවෙන් වසා ගැනීමට යෑම ඉතාමත් ඛේදජනකය. මේ වන විට රටේ පවතින විරෝධතා රැල්ල ඇතිවීමට හේතු සාධක මොනවාදැයි සොය බලනු වටී.

මහා ආර්ථික විශේෂඥයෙකු යැයි කියා ගන්නා වර්තමාන අගමැතිතුමා ප්‍රමුඛ රජය ගෙනයනු ලබන අශුභවාදී විනාශකාරී ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් කිහිපයක් දක්වනු කැමැත්තෙමි.

මහ බැංකු බැඳුම්කර වංචාව, රණවිරු දඩයම, රාජ්‍ය සම්පත් කුණු කොල්ලයට පිටරටුන්ට විකිණීම අධික බදු බර පැටවීම, එට්කා ගිවිසුම, අධික ජීවන බර, සයිටම් අර්බුධය, මැතිවරණ හිතා මතා කල් දැමීම කෘෂිකර්මාන්තය විනාශ කිරීම ඉන් කීපයකි.

තවද අමතක නොකළ යුතු කරුණක් වන්නේ ඕනෑම රජයක් තමන් බලයට පැමිණීමට පෙර ඉදිරිපත් කරන ප්‍රතිපත්ති සහ ප්‍රකාශන වලට මුළුමනින්ම පටහැනිව කටයුතු කරයි නම් එයට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලියන් ආරම්භවීම අහඹුවක් නොවේ.

ඒ අනුව දැන් සිදුවන්නේ පැහැදිලිවම එයම නේද ? එය එසේ වී නම් පැවති රජයට හෝ රාජපක්ෂලාට ගැරහීම තිරස-ˮචීන ක්‍රියාවකි. කළ යුතු වන්නේ විරෝධතා ඇති වීමට හේතු සොයා බලා ඒවාට පිළියම් යෙදීමය.

මාගේ අවංක පරමාර්ථය වන්නේ පැවති රජයට හෝ රාජපක්ෂලාට සුදු හුණු ගෑම නොවේ. අපි අත්විඳි යථාර්තය පැහැදිලි කර දීමයි.  ශ්‍රී ලංකාවේ එකල අපි රැකියාවට ගිය පසු ප්‍රමාද වී නොව පණ පිටින් ගෙදර පැමිණීම ප්‍රශ්නාර්ථයක් වී තිබිණි. බොහෝ විට උදේ වැඩට ගිය සමහරුන් සවසට ගෙදර ආවේ මිනී පෙට්ටියෙනි. සමහරවිට එයද සීල් තබා ඇති පෙට්ටියකි.

පැහැදිලිවම එම තත්වය වෙනස් කරන ලද්දේ රාජපක්ෂ ප්‍රමුඛ එවකට පැවති රජයයි. අපි සැමදා එයට ණයගැති වෙමු. එම නිසා රාජපක්ෂවරුන් රටේ සතුරන් නොව සියලුම ශ්‍රී ලාංකිකයින් ගේ ගැලවුම් කාරයින්ය.

සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ආදී සියලු දෙනා සාමයෙන් සතුටින් හා මරණ බියෙන් තොරව අද ජීවත් වන්නේ ඔහුන් නිසාවෙනි.

එම ලියුම්කරුට අනුව කෘතහස්ත දේශපාලනඥයෙකු වූ වර්ථමාන අගමැතිතුමාගේ අතීත කටයුතු මට මතක ඇති පරිද්දෙන් කෙටියෙන් විස්තර කරනු කැමැත්තෙමි. 88/89 වර්ෂ කාලයේදී 60000 පමණ තරුණ ජීවිත විනාශ කිරීමට වග කිය යුතු, එවකට පැවති රජ්යේ වගකිය යුතු ඇමති ධූරයක් දැරීම ප්‍රභාකරන් සමග දේශ ද්‍රෝහී ගිවිසුම් ගැසීම, සහ අධ්‍යාපන ධවල පත්‍රිකාව වැනි රටට අහිතකර ක්‍රියාවලී සඳහා ඔහු සෘජුවම දායක වීම ඉන් කරුණු කීපයකි.

තවදුරටත් සඳහන් කිරීමට මා හට අවශ්‍ය වන්නේ අපගේ පියවි ඇසට පෙනෙන හෝ අපට සංවේදී කාරණා කවුරුන් විසින් කරන ලද්දේද යන්න මහජනතාවට පැහැදිලි කරදීම පමණකි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රථම අධිවේගී මාර්ගය, දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල, ගල් අඟුරු බලාගාරය සහ මහා මාර්ග පද්ධතිය සහ අත්‍යවශ්‍යව තිබූ දැවැන්ත පාලම් පද්ධතිය යන දේවල් පැවති රජය හා රාජපක්ෂවරුන් ප්‍රමුඛව සිදුවූ යෝධ සංවර්ධන කටයුතු ලෙස සැලකිය හැකිය. කෘෂිකර්මාන්තය නගා සිටුවීම ද කිසිසේත්ම අමතක කළ නොහැකිය.

කෙසේ හෝ පැහැදිලිවම සඳහන් කළ යුත්තේ රාජපක්ෂවරුන් ප්‍රමුඛ පැවති රජයට අසත්‍ය දෝශාරෝපණ එල්ලකිරීම නවතා ජනතා සුභවාදී ක්‍රියා මාර්ග වලට නොපමාව අවතීර්ණ වීම වඩාත් උචිත බවයි.

නැතහොත් පවතින රජයේ පරිහානිය ඉතාමත් නුදුරේදීම දැකගනු හැකිවනු ඇත. අවසාන වශයෙන් කිය යුතුව ඇත්තේ පසුගිය දිනවල මීතොටමුල්ලේ කුණු කන්ද කඩා වැටීමෙන් අවාසනාවන්ත ලෙස සිදුවූ ජීවිත හානි ඇතුළු බරපතල හානිය පවා රාජපක්ෂවාදයට බැර කළහොත් එයද පුදුමයට පත්වීමට කරුණක් නොවනු ඇති බවය.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන
තිසර ගුවන්විදුලිය www.thisara.com

